## හැඳින්වීම

ළූණු අප රටේ ආහාර කර්මාන්තයේ ඉතා සැලකිය යුතු ස්ථානයක් හිමිකරගනු ලබයි. මෙහිදී පොකුරු ළූණු දෛනික ඒක පුද්ගල අවශ්‍යතාවය කි.ග්‍රෑ. 4ක් බැව් සෞඛ්‍ය වෛද්‍ය පර්යේෂණායතනය පවසා ඇත. වර්ෂ 2010 වන විට එම ප්‍රමාණය මෙ. ටොන් මිලියන 100ක් පමණ වන අතර දැනට වාර්ෂිකව නිපදවනුයේ අවශ්‍යතාවයෙන් 85% ක් පමණි. ඉතිරි ප්‍රමාණය ආනයනයෙන් සහ ලොකු ළූණු ආදේශනයෙන් සපුරා ගැනේ.

ලොකු ළූණුවලට සාපේක්ෂව පොකුරු ළූණුවලට වෙළඳපොළේ වැඩි මිලක් හිමිවන අතර ගුණාත්මයෙන් ඉහල නිෂ්පාදන මඟින් අවශ්‍යතාවය සපුරා ගැනීමට, ආනයනය කරමින් පවතින ලොකු ළූණු අවශ්‍යතාවයෙන් 50% පමණ ප්‍රමාණයෙන් සැලකියයුතු කොටසක් අඩුකර ගැනීමේ හැකියාවක් ද පවතී. තවද මෙම බෝගය ප්‍රධාන කන්න දෙකේදීම වගා කිරීමේ හැකියාව සහ කොළ එළවළුවක් ලෙස වසර පුරාම පවතින ඉල්ලුමට ගලපා ගතහැකි වීමද විශේෂ අවධානයට යොමුවිය යුතු කරුණුය.

කෙසේ වෙතත් සම්ප්‍රදායික රෝපණ ද්‍රව්‍ය වන බීජ බල්බිකා යොදා ගනිමින් මෙම ඉලක්ක කරා යෑම ගැටළුකාරීය. මෙම රෝපණද්‍රව්‍ය ඉතා විශාල ප්‍රමාණයක් අවශ්‍යවීම, එම හේතුවෙන්ම රෝපණද්‍රව්‍ය සඳහා අධික නිෂ්පාදන පිරිවැයක් (65%) පමණ දැරීමට සිදුවීම, රෝපණ ද්‍රව්‍ය සත්‍ය බීජවලට සාපේක්ෂව මෘදුවීමෙන් ගබඩාකරණය සහ ප්‍රවාහනය අපහසුවීම මෙන්ම ගුණාත්මයෙන් යුතු රෝපණ ද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා ගැනීමේ ගැටළු ඇති කරයි.

නමුත් සත්‍ය බීජ යොදා ගනිමින් ලොකු ළූණු මෙන්ම මෙම වගාවද කරගෙන යෑමට හැකියාව පවතී. ඒ මඟින් බීජ සඳහා වැයවන මුදල හෙක්ටයාරයකට රු. 138,000.00 (66%) කින් පමණ අඩුකරගත හැකිවන අතර සාපේක්ෂව ප්‍රමාණයෙන් විශාල බල්බිකා ලබා ගැනීමෙන් ගුණාත්මය වැඩි නිෂ්පාදනයකට හිමිකම් කිව හැකිය. මීට අමතරව රෝපණද්‍රව්‍ය මඟින් පැතිරෙන පළිබෝධ ව්‍යාප්තිය වළකාගත හැකිවීමද වැදගත් කරුණක් වන්නේය.

## බීජ අවශ්‍යතාවය

මෙම බීජ ලොකුළූණු බීජවලට වඩා තරමක් කුඩාවන බැවින් හෙක්ටයාරයක් සඳහා කි. ග්‍රෑ. 6 ක් ප්‍රමාණවත් වේ.

## තවාන් කළමණාකරණය

තවාන් සැකසීම සහ නඩත්තුව ලොකුළූණු තවාන්වලට බෙහෙවින් සමානය. තවාන් කාලය සති 5 ක් පමණ වේ. තවාන් සමයේ සිසිල් වියළි කාලගුණයක් පැවතීම ඉතා සුදුසුය. තවාන සඳහා හොඳින් ආලෝකය ලැබෙන සහ ජලසම්පාදන පහසුකම් ඇති ස්ථානයක් තෝරාගත යුතුය. හොඳින් ජලවහනය සිදුවන හියුමස් සහිත සැහැල්ලු පසක් ඇති පෙර කන්නයේ බෝග වගා නොකළ හෝ ධාන්‍ය බෝගයක් වගාකළ භූමියක් වඩාත් සුදුසු වේ.

වල් පැලෑටි සහ ගල් බොරළු ආදිය ඉවත්කර සෙ.මී. 15 ක් පමණ ගැඹුරට පස බුරුල් වන සේ තවාන් පාත්ති සකසාගත යුතුය. තවාන් පාත්තිවල පළල තීරණය වන්නේ පස් බාණ්ඩය අනුව සහ ජල සම්පාදන ක්‍රමය අනුවයි. මේ සඳහා සෙ.මී. 100 ක් හෝ 75 ක් පළල පාත්ති සකසා ගත යුතුය. පාත්තියක දිග මීටර 3 ක් පමණ වන සේ ද උස සෙ.මී. 15 ක් වන සේ ද සාදා ගැනීම සුදුසුය. බීජ ප්‍රමාණය සෙ.මී. 100 ක් පළල පාත්තියකට ග්‍රෑ. 45 ක් පමණද සෙ.මී. 75 ක් පළල පාත්තියකට බීජ ග්‍රෑ. 30 ක් පමණද ප්‍රමාණවත් වේ. තවාන් පාත්තිවල බීජ යෙදීම පේළි ආකාරයට හෝ අහඹු ලෙස වැපිරීම කළ හැකිය. වියලි බල්බ සකසා ගන්නේ නම් බීජ වැපිරීම වඩා සුදුසුය.

බිම් සකස් කිරීමේදී මූලික පොහොර ලෙස එක් පාත්තියක් සඳහා කාබනික පොහොර කි. ග්‍රෑ. 3 ක් ත්‍රිත්ව සුපර් පොස්ෆේට් ග්‍රෑ. 30 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් ග්‍රෑ. 15 ක් සහ යුරියා ග්‍රෑ. 20 ක් හෝ ඇමෝනියම් සල්ෆේට් ග්‍රෑ. 45 ක් යෙදිය යුතුය.

තවාන් පාත්ති ජීවාණුහරණය සඳහා හොඳින් සැකසූ පාත්ති පාරදෘශ්‍ය තුනී පොලිතීන් හෝ සෙලෝෆේන් යොදා වායුරෝධනය වන ලෙස සති 2 ක් සූර්යෝෂ්ණීකරණය වීමට සැලැස්විය යුතුය. රසායනික ක්‍රමය යොදා ගන්නේ නම් තයෝෆනේට් මෙතිල් 50%+ තිරාම් 30%, කැප්ටාන් හෝ තිරාම් යෙදීම කළ හැකිය. බීජ ප්‍රතිකාරය සඳහාද ඉහත සඳහන් එක් දිලීරනාශකයකින් ග්‍රෑ. 2ක් බීජ කි. ග්‍රෑ. 1 ට මිශ්‍ර කිරීම ප්‍රමාණවත් වේ.

බීජ යෙදීමෙන් පසු ජීවාණුහරණය කළ තුනී පස් තට්ටුවකින් (සෙ.මී. 1 ක් පමණ) වසා එයට පිදුරු හෝ වියලී ගිය තණකොළ සෙ.මී. 1 ක් පමණ ඝනකමට යොදා ආවරණය කොට හොඳින් ජලය සැපයිය යුතුය. දිනපතා ජලය යෙදීම කළ යුතු අතර දින 4 කින් පමණ අතුරණු ඉවත්කොට විනිවිද පෙනෙන පොලිතීන් යොදා ආවරණය කළ යුතුය. දිනපතා සූර්යාලෝකයට නිරාවරණය කරන පැය ගණන වැඩි කරමින් සතියක් පමණ වන විට සෙවණ ඉවත් කළ හැකිය. නමුත් ඒවා වර්ෂාව පවතින විට පමණක් වර්ෂා ආවරණයක් ලෙස පවත්වා ගැනීම වඩාත් සුදුසුය. තවානේ පැල ලා කොළ පැහැයට හැරෙන්නේ නම් 2% යූරියා ද්‍රාවණයක් යොදා නැවත පත්‍ර හොඳින් සේදී යන පරිදි පිරිසිදු ජලය යෙදිය යුතුය.

## බීජ පැල සිටුවන ක්ෂෙත්‍රයේ බිම් සකස් කිරීම

වල් පැලෑටි ආදිය ඉවත්කර සෙ.මී. 15ක් පමණ ගැඹුරට පස බුරුල්කර පස් බාණ්ඩය සහ ජල සම්පාදන ක්‍රමයට ගැලපෙන ලෙස භූමිය සකස්කරගත යුතුය. බීජ පැල සිටුවන අවස්ථාව වන විට දිරා යන කාබනික ද්‍රව්‍ය නොපැවතීමට වගබලා ගැනීමෙන් පාදස්ථ කුණුවීමට පාත්‍රවීමේ ප්‍රවනතාවය අඩුකරගත හැකිය.

| මූලික පොහොර | (කි.ග්‍රෑ./හෙක්.) |
|---|---|
| කාබනික | 10,000 |
| ත්‍රිත්ව සුපර් පොස්ෆෙට් | 100 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | 50 |
| යූරියා 65 හෝ ඇමොනියම් සල්ෆේට් | 150 |

පසේ පි.එච්. අගය 6.5 ට වඩා වැඩි අවස්ථාවල යූරියා වෙනුවට ඇමෝනියම් සල්ෆේට් යෙදීම වඩා සුදුසුය. තවද එමඟින් සල්ෆර් ප්‍රමාණයක්ද පසට එක්වීම බෝගයේ එම පෝෂකයේ අවශ්‍යතාවය සපුරාලීමට හේතු වේ.

## බීජ පැල සිටුවීම

බෝගයේ වර්ධන අවධියේ සිසිල් වියළි කාලගුණයක් සහ බල්බිකා මෝරන අවධියේ උණුසුම් වියලි කාලගුණයකට හසුවන සේ වගා කරන කාලය ගලපා ගත යුතුය.

සති 5 ක් පමණ වයසැති පත්‍ර 3 ක් හෝ බල්බිකා වර්ධනය ඇරඹී ඇති පැල තෝරා සිටුවිය යුතුය. සිටුවන පරතරය වන්නේ පේළි අතර සහ පැල අතර සෙ.මී. 8 ය. සිටුවිය යුතු ස්ථාන සලකුණුකර ගැනීම සඳහා සරල උපකරණ යොදාගත හැකිය.

## ජල සම්පාදනය

බීජ පැල සිටුවීම කළ යුත්තේ තෙතමනය සහිත පසේය. ක්ෂේත්‍ර ධාරිතාවය පවත්වා ගැනීමට පමණක් ප්‍රමාණවත් වන තෙතමනයක් තබා ගැනීම ඉතා වැදගත්ය. ඉසින ජල සම්පාදනය වඩා සුදුසුය.







## වල් පැළෑටි කළමණාකරණය

වල් පැළෑටි වලින් තොර වගා බිමක් පවත්වා ගැනීම අස්වනු ප්‍රමාණය සහ ගුණාත්මය වැඩිකර ගැනීමට හේතු වේ. විශාල වගාවකදී රසායනික වල් මර්ධනය භාවිත කළ හැකිය. මේ සඳහා පූර්ව නිර්ගමන වල් නාශකයක් පැල සිට වූ වහාම හෝ පසුදින යෙදිය යුතුය. වල් නාශක යොදන අවස්ථාවේ පස හොඳින් තෙත්ව තිබිය යුතු අතර වල් නාශක යෙදීමෙන් පසු යටි පස් මතුපිටට පැමිණෙන ආකාරයේ රෝපණ කටයුතු නොකළ යුතුය. මතුපිට පොහොර යොදන අවස්ථාවලදී වල් පැළෑටි ඉවත්කර තිබීම අත්‍යවශ්‍ය සාධකයකි.

## මතුපිට පොහොර යෙදීම

බීජ පැල සිටුවීමෙන් සති 3 කට පසු යූරියා 65 කි. ග්‍රෑ./හෙ. ට යෙදිය යුතුය. නැවත සති 6දී යූරියා 65 කි. ග්‍රෑ./හෙ. ට සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් 35 කි. ග්‍රෑ./හෙ. ට ද යෙදිය යුතුය.

## රෝග

*පාදස්ථය කුණුවීම*

දිලීර වර්ග එකකින් හෝ කිහිපයක් නිසා ඇතිවන අතර බල්බිකා ගබඩා අවධියේ සිට ඕනෑම වර්ධක අවධියකදී ඇතිවිය හැකිය. පාලනය සඳහා බීජ ප්‍රතිකාරය සහ පැතිරීම වලක්වා ගැනීම සඳහා නිර්දේශිත දිලීරනාශකයක් යොදා ගනිමින් පස තෙත් කිරීම අවශ්‍ය වේ.





*දම් පැල්ලම් රෝගය*

ඕල්ටනේරියා පොරි නමින් හැඳින්වෙන දිලීරයක් නිසා දම් කළු අක්ෂි ආකාර පුල්ලි පත්‍ර, පුෂ්ප නටු සහ ඡත්‍ර මත ඇති වේ. තෙත් සිසිල් කාලගුණික තත්ත්ව යටතේ මෙම රෝගය දැඩි හානි සිදු කරයි. තවද ඇන්ත්‍රැක්නෝස් ඇති කරන දිලීර මඟින්ද මීට සමාන ලක්ෂණ ඇති කළ හැක. කළමණාකරණය සඳහා ක්ලෝරොතැලොනිල්, ප්‍රොපිනෙබ්, ටෙබියුකොනොසෝල් වැනි දිලීරනාශක ආරම්භයේදීම යෙදිය යුතුය.





*පැල මැක්කන්*

උණුසුම් වියළි කාලගුණික තත්ත්ව යටතේ මෙම කෘමියා ඉතා සීග්‍රයෙන් බෝ වේ. ළූණු පත්‍ර සූරා යුෂ උරා බීම නිසා හානිය සිදු වේ. පාලනය සඳහා ජල සම්පාදනය මඟින් පත්‍ර වියන සිසිල්ව පවත්වා ගැනීම වැදගත් වේ. හානිය වැඩි වන්නේ නම් ඉමිඩැක්ලොප්‍රිඩ්, තයොක්ලොප්‍රිඩ්, ෆිප්රොනිල් හෝ ප්‍රොතියොෆොස් වැනි නිර්දේශිත කෘමි නාශකයක් යොදා ගැනීම සුදුසුය.





*ළූණු පත්‍ර කන දළඹුවන්*

කළමණාකරණය සඳහා ඉමැමෙක්ටින් බෙන්සොඒට්, ඉමිඩැක්ලොප්‍රිඩ්, තයක්ලොප්‍රිඩ්, පිප්‍රොනිල් හෝ ප්‍රොතියොෆොස් වැනි කෘමිනාශක යොදාගත හැකිය.





## අස්වනු නෙලීම

සිටුවා දින 90-105 පමණදී බල්බිකා සඳහා නෙළාගත හැකිය. ගෙළ අසලින් 25-50% කඩා හැලෙන අවස්ථාවේදී ජල සම්පාදනය නතර කොට සති 2 කින් පමණ ගලවා මඳ පවනේ වියළීමට හැර බීජ බල්බිකා ගන්නේ නම් මිටි බැඳ එල්ලා තැබීම හෝ පරිභෝජනය සඳහා නම් වියලි පත්‍ර බල්බිකා අසලින් කපා වෙළඳපොළට යැවිය හැක. වෙළඳපොළට යැවීමට ප්‍රථම තවත් දින 10ක් පමණ සිසිල් වියළි තත්ත්ව යටතේ පදම් වීමට හැරීමෙන් බල්බිකාවලට තීව්‍ර වර්ණයක් ලබාදෙන අතර ප්‍රවාහනයේදී සහ ගබඩාකරණයේදී කුණුවීම අවම කරගත හැක.


**විමසීම්:**

නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
අරලගංවිල
දුරකථන: 060-2279699 / 027-5671054
ෆැක්ස්: 027-5671054



Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture.


අපි වවමු - රට නඟමු
දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම

# පොකුරු (රතු/කුඩා) ළූණු සත්‍ය බීජ මගින් වගාව




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
2009